**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

**දෙවන වාර පරීක්ෂණය - 2008**

**ක්‍රිස්තු ධර්මය (රෝ.ක. නොවන) - 9 ශ්‍රේණිය**

**නම :**

**විභාග අංකය :** **කාලය පැය 02 යි**

## I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

**හිස්තැන් පුරවන්න.**

1) ශුද්ධ වූ බයිබලය පොත් ........................................... කින් සමන්විතය.
2) ශුද්ධ වූ බයිබලයේ පළමු පොත් පහත කියන නමකි. ....................................................
3) ශුද්ධ වූ බයිබලය ශත වර්ෂ ......................................... ක් තුළ ලියවිණි.
4) ඊශ්‍රායෙල් හි පළමුවන රජතුමාගේ නම ..................................................... ය.
5) ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් සඳහා යොදා ගත් භාෂාව .............................................

නිවැරදි පිළිතුර යටින් ඉරක් ගසන්න.

6) "වල්ගේට්" හි කතුවරයා කවුද? (ශු. ජෙරොම් තුමා, ජෝන් වයික්ලිෆ් තුමා)
7) ශුද්ධ ලියවිලි ජන ගී ලෙස ගැයුවේ කවුද? (සීඩ්මෝන්, ජේම්ස් රජ)
8) ජර්මනියේ ආගමික ප්‍රතසංස්කරණ දියත් කළ පූජකතුමාගේ නම කුමක්ද?
(මාර්ටින් ලූතර්, ජෝන් වයික්ලිෆ්)
9) ක්‍රි.ව. 1526 ජර්මනියේදී ඉංග්‍රීසි නව ගිවිසුම මුද්‍රණය සඳහා සකස් කලේ,
(ශු. ජෙරොම් තුමා, විලියම් ටින්ඩේල් තුමා)
10) තමාට දුන් නිදහස සහ බලය අයුතු ලෙස පාවිච්චි කළ පළමු මිනිසා කවුද? (ආබ්‍රහම්, ආදම්)

**නිවැරදි පිළිතුර ලියන්න.**

11) ආදි පිතෘවරයෙකි ...................................................................................................
12) ජල ගැල්මෙන් ලොව විනාශ නොකරන බවට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුවේ
සංකේතය ...................................................................................................
13) ඊසාක් ගේ බිරිඳගේ නම ...................................................................................
14) මෝසෙස්ගේ සොහොයුරිය ...............................................................................

15) බාල් දෙවියාගේ පූජාසනය කඩා දැම්මේ ..........................................................................................

16) "එලියා" යන නමෙහි අර්ථය ..........................................................................................

17) "ලෝ අම්මා" යන්නෙහි අර්ථය ..........................................................................................

18) තම සහෝදරයින්ට ආහාර දීමට යුධ කඳවුරට ගියේ ..........................................................................................

19) කිතුනු සභාවේ විශ්වාසනීය ලංඡනය ..........................................................................................

20) බෞද්ධ ජනතාව පොසොන් උත්සවය පවත්වන්නේ ..........................................................................................

**මෙම ප්‍රකාශන කළේ කව්ද?**

21) "සමිඳාණන් වහන්ස මට උත්තර දුන මැනව.

..........................................................................................

22) "මාගේ දේශයේදී ඔබේ ක්‍රියා හා ඔබේ ප්‍රඥාව ගැන මා ඇසූ ආරංචි සැබෑය."

..........................................................................................

23) "ඔබේ ජීවිත රකිනු පිණිස දෙවියන් වහන්සේ මා මෙහි එවූ සේක."

..........................................................................................

24) "සිංහයාගේ නිය පහරින්ද, වලසාගේ නිය පහරින්ද, මා ගැලෙව් ස්වාමීන් වහන්සේ"

..........................................................................................

25) "මහෝත්තම දෙව් ස්වාමීන් වහන්සේ කතා කරන සේක. දිවැස් වැකි නොකියා සිටිය හැක්කේ කාටද?" ..........................................................................................

26) "ඔබ ගොස් තෙල් විකුණා ණය ගෙවා ඉතිරි මුදලෙන් ඔබත් ඔබේ පුතයාත් රක්ෂා කරන්න.

..........................................................................................

27) "මාගේ පියාණෝ සාමාන්‍ය කසවලින් ඔබට දඬුවම් කළහ"

..........................................................................................

28) "අප පාලනය කරනු පිණිස රජෙක් දුන මැනව"

..........................................................................................

29) හිරු දෙවියන්ට කිරිබත් පූජා කිරීමෙන් පවත්වන හින්දු උත්සවය .......................................... ය.

30) "ක්‍රිස්තුස් වහන්සේට අත් නැත. ඇත්තේ ඔබේ .......................................................... ය.
ක්‍රිස්තුස් වහන්සේට පා නැත. ඇත්තේ ඔබේ .......................................................... ය.

**(1 x 30 = 30)**

## II කොටස

### 1) කෙටි පිළිතුරු සපයන්න. (වාක්‍ය 4ක් ලියන්න.)

1. තම ගිවිසුම පමණක් එක පොතක් ලෙස ඉදිරිපත් කරන්නේ ඇයි?
2. මුල් අවධියේදී ශුද්ධ ලියවිලි ලිවීමට හකුලන පොත සෑදුවේ කෙසේද?
3. ඒසව් ගැන හැඳින්වීමක් කරන්න.
4. මිසරවරු වහලුන්ට සැලකුවේ කෙලෙසද?
5. පරණ ගිවිසුමෙ හා නව ගිවිසුමේ සඳහන් පාස්කු උත්සව වල වෙනස ලියන්න. (4 x 5= 20)

### 2) පිළිතුරු ලියන්න.

1. i. පිලිස්තිවරු ඊසාක්ට විරෝධය පළ කලේ කෙසේද?
   ii. ඊසාක්ගේ ප්‍රතිචාරය කෙබඳු වීද?
   iii. එයින් අපට දෙන පණිවිඩය කුමක්ද?

2. i. අබියා යනු කව්ද?
   ii. අබියා තම සලුවට කුමක් කළේද?
   iii. සලමොන් රජ කල බරපතල වරද කුමක්ද?

3. i. මිසරයේ රජතුමා දුටු සිහින මොනවාද?
   ii. දෙවියන් වහන්සේ සිහින මගින් ඔහුට එළිදරව් කළේ කුමක්ද?
   iii. සිහින තේරු පසු රජතුමාගේ ක්ෂික ප්‍රතිචාරය කුමක්ද?

4. i. පැරණි ගිවිසුම මුලින්ම ලියුවේ කුමන භාෂාවෙන්ද?
   ii. සෙප්තුවාජින්ට් යනු කුමක්ද?
   iii. ශුද්ධ ලියවිලි වෙනත් භාෂාවන්ට පරිවර්තනය කළේ ඇයි?

5. i. යෙසායා දිවැසිවරයා කාගේ පුත්‍රයාද?
   ii. ඔහු කල කිරීමට පත්වූයේ ඇයි?
   iii. දේව මාලිගයේදී යෙසායාට දේව කැඳවීම ලැබුණේ කෙසේද?

6. i. සලමොන් රජගේ පියා කවුද?
   ii. ඔහු සියල්ලටම වඩා අනගි ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලුවේ කුමක්ද?
   iii. රජතුමාගේ ප්‍රඥවන්ත හා යුක්ති සහගත විසඳුමක් ලියන්න. (5 x 6= 30)

### 3) ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

1. එසව් හා ජාකොබ් මුණගැසී සමාව දී සමගිය ඇති කර ගත් ආකාරය විස්තර කරන්න.
2. කර්මෙල් කන්දේදී එලියා සමිඳාණන් වහන්සේ බව ඔප්පු කළ අයුරු විස්තර කරන්න.
3. ඔබ ශුද්ධාත්ම දානය ලැබූ අයෙකු යැයි සිතා ජීවිතයේ ඇති වූ වෙනස්කම පහදමින් මිතුරෙකුට ලිපියක් ලියන්න. (6 x 2= 30)

### 4) චිත්‍ර මගින් ඉදිරිපත් කරන්න.

1. ඊශ්‍රායෙල් සෙනඟගේ විනාශය ඉතාමත් ආසන්න බව දෙවියන් වහන්සේ විසින් ආමොස් දිවැසිවරයාට දන් වූ දර්ශනය.
2. ජේසු උපත සිහිකරන ගවලෙනක දර්ශනය (4 x 2= 8)